# “මිතුරන් දෙදෙනා සහ පොරව” රසාස්වාදය

“කලාව කලාව උදෙසා නොව කලාව ජනතාව උදෙසා ය” යන ජනතාවාදී මතය පෙරදැරිව හැත්තෑව දශකයේ කාව්‍යකරණයට පිවිසි ප්‍රතිභාසම්පන්න කවියකු වශයෙන් පරාක්‍රම කොඩිතුවක්කු කවියා හැඳිනවිය හැකි ය. ප්‍රථම කාව්‍ය සංග්‍රහයේ සිට ම උසස් කවිත්වයක් පළ කළ හෙතෙම සම්මානනීය සාහිත්‍යධරයෙකි.

නිර්දිෂ්ට “මිතුරන් දෙදෙනා සහ පොරව” පද්‍ය පන්තිය 2000 වර්ෂයේ දී ප්‍රකාශයට පත් කළා වූ ඔහුගේ “ලොවි කහට” නම් කාව්‍ය ග්‍රන්ථය තුළ එන්නකි. පරාක්‍රම කවියා ගැමි කම්කරු සමාජයේ දුක්ඛිත දිවි පැවැත්ම සිය කවියේ ආත්මය කොට ගත් සෙයකි. මුදලාලිකරණයට නතු වූ ග්‍රාමීය ශ්‍රමිකයන් ශ්‍රම සූරා කෑමට ලක්වීමත් ඔවුන් මුහුණ දෙන්නා වූ කටුක අනාරක්ෂිත ජීවනෝපාය මාර්ගයත් පිළිබඳව අංශු මාත්‍රයක් පාඨකයා හමුවේ තැබීම මෙම කවෙහි අරමුණ වූ බව පෙනේ. කවියා ඊට වස්තු විෂය වශයෙන් දවසේ කුලියට දර වැඩපලක රැකියාව කරන කතකයා, විමලේ සහ මුදලාලි යන චරිත කිහිපයත් දර වැඩපලට පසුබිම් වූ වටපිටාවත් යොදා ගෙන ඇත.

කවියත් වාර්තාකරණයත් අතර පැහැදිලි වෙනසක් පවතී. කවියාත් වාර්තාකරුවාත් දෙදනාම සිදු කරන්නේ සන්නිවේදන කාර්යයක් බව සැබවි. වාර්තාකරුවා සිය ප්‍රකාශනය සෘජුවම ඉදිරිපත් කරන අතර කවියා විසින් කාව්‍යෝපක්‍රම තුළින් පෝෂිත කොට සිය අවධාරිත ධාරණාව ට අමතරව රසයක් චමත්කාරයක් ද පාඨකයා වෙත ප්‍රදානය කරනු ලැබේ. මෙහිදී අප කවියා භාවිතා කරන භාෂාව, ආකෘතිය, අපූරු නව්‍ය යෙදුම්, ජන කවියේ ආභාසය, ජනප්‍රවාද කවියට ගෙන ඒම, වාග් චිත්‍ර මැවීම, සංක්ෂිප්ත බව සේම කවියා තුළ තිබූ ආත්ම දමනය ද රසෝත්පාදන කාර්යයෙහිලා ඉවහල් වී දැයි විමසා බලමු.

www.Artsapi.lk

කවියා භාවිතා කරන භාෂාව ඉතාමත් සරල ය. සුගම ය. දුරවබෝධ වචන කිසිවකුත් මේ කව තුළ හමු නොවේ. එබැවින් අර්ථ ග්‍රහණය කර ගැනීම ද අපහසු නොවේ. කවියා සිය කවිබස මුලුමනින්ම පාහේ කටවහරත් වර්තමාන ව්‍යවහාර භාෂාවත් ඇසුරින් සකස් කරගෙන ඇති බව පෙනේ. එහෙත් එම බස කිසිසේත්ම ධ්වනිපූර්ණ ගුණය අතින් ද විනිර්මුක්ත නෙවේ.

"එදා සිටන් තරඟෙට අපි දර පැලුවා
වනන්තරේ ඉර හඳ දුක සැප බැලුවා
කැලෑ කොළේ ගණනට දහඩිය හෙලුවා
බැද්දේ කුරුල්ලන් නොනිදා හඬ තැලුවා"

සැබවින්ම දර පැලීම සඳහා ඔවුන් අතර තරඟයක් නැත. නමුත් කතකයා සහ විමලේ යන දෙදෙනාට ම ඉන් එහා ගිය තරඟයක් ඇත. ඒ ජීවත් වීමේ තරඟයයි. මොහොතකට හෝ ඉන් නැවතුනහොත් ඔවුහු පරාජිතයෝ වෙති. ඔවුනගේ දුක සැප විමසීමට මහ වන මැද කිසිවකුත් නොවේ. එබැවින් ඉර හඳ යන අචේතනික වස්තූන් පමණක් දුක සැප බැලූ බව කියයි. "කැලෑ කොළේ ගණනට දහඩිය හෙලුවා" යන්නෙන් ගම්‍ය වන්නේ ජීවිතය ජීවත් කරවීමෙහිලා අධිකතර වෙහෙසට පත් වීමයි. නොනිදා හඬ නඟන කුරුලු කූජනයට සමපාත වන්නේ ඔවුනගේ ජීවන ගීතය ම ය. මෙබඳු අයුරින් කාව්‍ය පුරාම රසෝත්පාදනයෙහිලා කවියාගේ භාෂා භාවිතාව උත්තම ගණයෙහිලා සැලකිය හැකි ය.

කවියා සිය පද්‍ය සඳහා ආකෘතිය වශයෙන් යොදා ගන්නේ එලිසමය සහිත සිව්පද ආකෘතියයි. පද්‍ය පුරාම එකම රිද්මයක් පවත්වා ගැනීමෙහිලා ඒකාකාරී විරිතක් භාවිතා කරයි. එය ද ජන කාව්‍යයට නෑකම් කියන බෙහෙවින් සරල විරිතකි. භාෂාවෙන් විරිතෙන් මතු නොව ජනප්‍රවාදයේ එන ජනකතා තුළින් ද කවියා සිය අත්දැකීම ප්‍රකාශනයෙහිලා ලබා ඇත්තේ මහත් ආලෝකයකි.

Sameera

"මතකද එදා දර පැලුවා පහළ කැලේ
වැටුණා පොරව විසිවී ගඟ හැරෙන වලේ
මුදලාලිගේ බැණුමෙන් මා තැලෙන වෙලේ
පැන්නේ ඔබයි පිහිනන්නට ගලන ජලේ"

ජනප්‍රවාදයේ එන කතාවට අනුව පොරවක් ලබා දීමට පැමිණෙන්නේ ශක්‍ර දේවේන්ද්‍රයා ය.නමුත් සත්‍ය ලෝකය තුළ එබන්දක් නැත.මුදලාලිගේ බැණුමෙන් පීඩිත වන කතකයාට පිළිසරණට පැමිණෙන්නේ ඔහුගේ ම පන්තිය නියෝජනයක් කරන්නාවූ විමලේ නම් කළ්‍යාණ මිත්‍ර තෙමේ ය. ස්වකීය ප්‍රකාශනය සඳහා ජනප්‍රවාදය උපයෝගී කර ගැනීමේ දී රචනයා සිය පරිකල්පනය මෙහෙයවා ඇති ආකාරය ප්‍රශංසනීය වේ. ඉන් උසස් රස වින්දනයකට අවකාශය සලසා ඇත.

කවියා අපූරු නව්‍ය යෙදුම් තුළින් ද පාඨක රසිකයා වෙත තිළිණ කරන්නාවූ වින්දනය ද වචනයේ පරිසමාප්ත අර්ථයෙන් ම අපූරු ය.

"පොරෝ තලේ පිට සඳ රැස් බින්දු නටයි"

"නාගෙන වතුර පොඩිවී නැති ගඟට පැන"

"ඔබ හිස ගසා ගත්තේ පොළොවේ කිමද"

පළමු පද්‍ය පාදයෙන් මුවහත් තැබූ පොරෝ තලයට චන්ද්‍රාලෝකය වැටී ඇතිවන දීප්තිය පෙර නොවූ විරූ සිදුවීමක් ලෙස පාඨක සිතේ චිත්‍රනය වේ. අචේතනික වස්තුන්ගේ සිදුවන්නා වූ ස්වභාවික සංසිද්ධියක් වුව ද රචකයා "සඳ රැස් බින්දු නටයි" යනුවෙන් ඊට සප්‍රාණික බවක් ආරෝපනය කරයි. "නාගෙන වතුර පොඩිවී නැති ගඟට පැන" යන

Sameera

www.Artsapi.lk

යෙදුම ද එතරම් ම අපූරු ය. ජලය බොර වීමක් මිස පොඩි වීමක් සිදු නොවේ. පොඩි වන්නේ ඇඳුම්, කඩදාසි වැනි දෑ ය. නමුත් එම යෙදුමෙන් පාඨක සිතේ වචනාතික්‍රාන්ත චමත්කාරයක් මැවේ. “ ඔබ හිස ගසා ගත්තේ පොළවේ කිමද” යනුවෙන් යෙදීමෙන් විමලේ තුළ වූ අප්‍රමාණ මානව දයාවත් මිත්‍රශීලී ගුණයත් මූර්තිමත් කෙරේ. ඉන් ප්‍රබල ශෝකී රසයක් ද උත්පාදනය වේ. විවේක බුද්ධියෙන් රචනා වී තිබීමත් රචකයාගේ පැසුණු කවිත්වයත් නිසාම මෙම නිර්මාණයෙහි එකදු යෙදුමක් හෝ ඖචිත්‍යයෙන් ද විනිර්මුක්ත නොවේ.

එනයින් පරාක්‍රම කොඩිතුවක්කු කවියාගේ මිතුරන් දෙදෙනා සහ පොරව පද්‍ය පන්තිය රසවත් වූත් හරවත් වූත් පාඨක රසිකයාගේ ජීවිතාවබෝධය වඩන්නාවූත් ප්‍රශස්ත නිමැවුමක් මැයෙන් අගය කළ හැකි ය. රචකයාගේ පුද්ගලික ජීවන දෘෂ්ටිය වන්නේ මෙවන් මිනිසුන් වෙත ද අපගේ සානුකම්පිත අවධානය යොමු කළ යුතු බවයි.

සැකසුම: ආර් එම් සමීර රන්ජන් බණ්ඩාර (කොළඹ විශ්වවිද්‍යාලය)

Sameera